**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව උතුරුමැද පළාත**

**11 ශ්‍රේණිය - බුද්ධ ධර්මය**

**දෙවන වාර පරීක්ෂණය (2024)**

## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර | ප්‍රශ්නය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 02 | 02 | 01 | 03 | 02 | 04 | 03 | 05 | 04 |
| 06 | 01 | 07 | 03 | 08 | 01 | 09 | 04 | 10 | 02 |
| 11 | 03 | 12 | 02 | 13 | 04 | 14 | 01 | 15 | 01 |
| 16 | 03 | 17 | 02 | 18 | 02 | 19 | 01 | 20 | 01 |
| 21 | 01 | 22 | 03 | 23 | 01 | 24 | 01 | 25 | 03 |
| 26 | 02 | 27 | 02 | 28 | 03 | 29 | 04 | 30 | 03 |
| 31 | 03 | 32 | 01 | 33 | 02 | 34 | 02 | 35 | 04 |
| 36 | 04 | 37 | 03 | 38 | 03 | 39 | 02 | 40 | 01 |

### II - පත්‍රය

01) i) අනේපිඬු සිටුතුමා - ජේතවනාරාමය / දෙව්රම් වෙහෙර
විශාඛා මහෝපාසිකාව - පූර්වාරාමය / මිගාර මාතු පාසාදය

ii) බුදු, පසේ, බුදු, මහරහත්

iii) පංච අභිඥා
අෂ්ට සමාපත්තිය

iv) නිර්වාණ විනිශ්චය/පොහොය දිනය/ධර්ම විනිශ්චය /බෞද්ධයාගේ අත්පොත/පාරමිතා ප්‍රකරණය / අභිධර්ම මාර්ගය (පිළිතුරු අතරින් දෙකක්)

v) සිරිත් - කළයුත්ත
වාරිත් - නොකළ යුත්ත

vi) අනුවණයින් ඇසුරු නොකිරීම
නුවණැත්තන් ඇසුරු කිරීම (11 ශ්‍රේණිය 65/66 පිටු අනුව ලකුණු දෙන්න)

vii) දක්ෂ /නිරෝගී / නිවැරදි (පිළිතුරු අතරින් දෙකක්)

viii) ආහාරයෙහි පමණ දැන අනුභව කිරීම

ix) සෝණදණ්ඩ/වංකී/ පොට්ඨපාද /සකුළුදායි (මේ අතරින් දෙකක්)

x) උරුවේල කාශ්‍යප
නදී කාශ්‍යප
ගයා කාශ්‍යප (මේ අතරින් දෙදෙනෙක්)

02) i) ''සසර දුකට ප්‍රතිකාර කරන උතුම් වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේ ය.''

ii) පූතිගත්ත තිස්ස හිමි / මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ /උදරාබාධයකින් පෙළුණු භික්ෂුව/ මුගලන් මහ රහතන් වහන්සේ

iii) නීරෝගීකම උතුම්ම ලාභය බව ධම්ම පදයෙන් පෙන්වා දීමෙන් පසක් වන්නේ එහි ඇති වටිනාකමයි. බුදු දහම තුළ තම ශ්‍රාවක පිරිස නිදර්ශනයට ගනිමින් ඒ බව ප්‍රකාශ කොට ඇත.

* <u>කායික නිරෝගී බවට</u> විනය පිටකයේ කරුණු දක්වා තිබීම.

- පිරිසිදුව සිටීම, ස්නානය, සිවුරු පොරෝනාවල පිරිසිදු බව.
- පාවහන් භාවිතය.
- විවිධ වත් මඟින් පරිසරයේ පවිත්‍ර බව (ආගන්තුක වත / ගමික වත...)
- ගිලන්වීම වැලකීමට ''කැපසරුප් පාන'' වැළඳීම
- සේඛියා ධර්ම අනුව (සිවුරු පෙරවීම / ආහාර ගැනීම...)
- ප්‍රමාණවත් නින්දක් ලබා ගැනීම
- ශාරීරික ව්‍යායාම සඳහා සක්මන් මළුව නිර්දේශ කිරීම
- සෙනසුන් වත (චුල්ල වග්ග පාලිය වත්තක්ඛන්ධකය) වෙහෙර අවට හා තුළ පවිත්‍ර බවට කරුණු
- ප්‍රමාණවත් ජලය පානය (පෙරහන්කඩය ජලය පෙරා ගැනීමට)

* <u>මානසික නිරෝගී බවට</u> - භාවනාව

(10 ශ්‍රේණිය - 17 පාඩම සහ
11 ශ්‍රේණිය - 15 පාඩම ඇසුරෙන් ලියා ඇත්නම් ලකුණු දෙන්න)

03) i) ''සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච
යං වේ හිතංච සාධුංච - තං වේ පරම දුක්කරං''

ii) ''තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසු ය''

iii) බෞද්ධයාගේ අත්පොත, පන්සාලිස් වසක් පුරාවට බුද්ධ දේශිත ශ්‍රී සද්ධර්මයේ සාරය ලෙස සැලකෙන ධම්ම පදය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පහළවෙන් දෙවන ග්‍රන්ථය යි. ගාථා 423 කින් ද වග්ග 26 කින් ද, නිදාන කථා 299 කින් ද සමන්විත මෙය එදා මෙදා තුර බාල-මහලු, ගිහි-පැවිදි, ස්ත්‍රී - පුරුෂ හෝ ජාති, ආගම්, කුල, පක්ෂ භේදයකින් තොරව පරිහරණය කළ හැකි වටිනා ග්‍රන්ථයකි.

එහි එන සෑම ගාථාවකින් ම ඕනෑම කෙනෙකුට ජීවිතය සාර්ථක කර ගන්නට උපදෙස් සපයන අතර, වරදින් මිදී නිවැරදි සමාජයකට ගමන් කරන්නට ඒ මඟින් මහගු අත්වැලක් සපයයි.
(නිදසුන් ඇසුරින් පිළිතුර ගළපා ඇත්නම් ලකුණු දෙන්න.)

04) i) උට්ඨාන සම්පදා/ ආරක්ඛ සම්පදා/ කල්‍යාණ මිත්තතා/සමජීවිකතා (මේ අතරින් දෙකක්)

ii) උත්සාහයෙන්, දැතේ සවියෙන්, දහදිය වගුරුවා, ධාර්මිකව උපයාගත් ලෞකික ධනය විනාශ වී යාමට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීම ආරක්ඛ සම්පදාවයි. එසේ ඉපයූ ධනය විනාශ වන ක්‍රම සතරකි.
- රජයට අයත් වීම.
- සොරුන් විසින් පැහැර ගැනීම.
- ගින්නෙන්/ජලයෙන් (ස්වාභාවික උපද්‍රවවලින්) විනාශ වීම.
- තමා අප්‍රිය කරන අයට අයත් වීම.

iii) දෙවියෙක් ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් පිරිහීමේ කරුණු 21 ක් දක්වමින් බුදුරජාණන් වහන්සේ පරාභව සූත්‍රය දේශනා කරන ලදී.

එම පිරිහීමේ කරුණුවලින් යම් පුද්ගලයෙක් යුක්ත වන්නේ නම් නිතැතින් ම ඔවුන් පරිහානිය කරා ගමන් කරයි.

නිතර නිදන සුළු බව, නිතර දොඩමලු වීම, ස්ත්‍රීන් කෙරෙහි ලොල් බව, සුරාවට ලොල් බව, සූදුවට ලොල් බව (මහ ධන සිටු පුත් කථාව)

බාල ගති පැවතුම් ඇත්තවුන් ඇසුර...

(11 ශ්‍රේණිය 66/67 පිටුවල සඳහන් පිරිහීමේ කරුණු ඇසුරින් ලියා ඇත්නම් ලකුණු දෙන්න.)

05) i) වැරදි කරන මිනිසුන් අතර නිවැරදිව වාසය කිරීම.

කෙලෙස් නිසා ලෙඩ වූ පුද්ගලයන් අතර නිකෙලෙස්ව වාසය කිරීම.

ii) අවම පෞරුෂ/මධ්‍යම පෞරුෂ / උත්තම පෞරුෂ

iii) සමාජය සැමවිටම ගමන් කරන්නේ රාගයෙන් රාගයට, ද්වේශයෙන් ද්වේශයට හා මුලාවෙන් මුලාවටම ය. එය ගඟක් පහළට ගලනවා වැනිය. නමුත් බුදු දහම වූ කලී, උඩුගම් බලා යාමට වැරදි බහුල සමාජයේ නිවැරදිව වාසය කිරීමට මංපෙත් හෙළි කරන දහමකි. පද්මාකාර ජීවිතයෙන් සිසුන්ට ලබා දෙන ආදර්ශය වන්නේ, දුසිරිත් කරන සිසුන් අතරින් සුසිරිත් වඩමින් කල් ගෙවමින් තම ජීවිතය සාර්ථක කර ගන්නා ලෙසයි.

(10 ශ්‍රේණිය 10 පාඩම 59/60 පිටු ඇසුරින් පිළිතුර ගලපා ඇත්නම් ලකුණු දෙන්න.)

06) i) වසර 236 කට පසු

පැළලුප් නුවර අශෝකාරාමයේ දී

ii) ධර්මාශෝක රජතුමා (රාජ්‍ය අනුග්‍රහය)

මොග්ගලී පුත්ත මහ රහතන් වහන්සේ (මූලික වූ හිමිනම)

භික්ෂු පිරිස 1000

iii) නිර්මල වූ ථේරවාදී බුදු දහම රැක ගැනීම උදෙසා මහඟු සේවාවක් තෙවන ධර්ම සංගායනාවෙන් සිදු වූ බව

* දුසිල් මහණුන් හැට දහසක් සසුනෙන් නෙරපා හැර ශාසන සංශෝධනයක් සිදු කිරීම.
* වසර හතකට පසු නැවත විනය කර්ම ආරම්භ කිරීම.
* වැරදි මත පන්සියයක් ඉවත් කර ථේරවාදී මත පන්සියයක් එක් කරමින් කථාවත්ථුප්පකරණ ග්‍රන්ථය සම්පාදනය වීම.
* මේ නිසා අභිධර්මය සම්පූර්ණ වීමෙන් ත්‍රිපිටකය අංග සම්පූර්ණ වීම. (සූත්‍ර පිටකය කොටස් 05 / විනය පිටකය කොටස් 05 / අභිධර්ම පිටකය කොටස් 07 )
* දේශීය විදේශීය වශයෙන් රටවල් හා ප්‍රදේශ ඇතුළත් ප්‍රදේශ නවයකට ධර්ම ප්‍රචාරය සිදු වීම. (වගුව ඇසුරින්)

ආදී කරුණු විස්තර කරමින් ථේරවාදී සම්ප්‍රදායට වූ මෙහෙය ලියා ඇත්නම් ලකුණු දෙන්න.

07) i) <u>**දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.**</u>

- බුදුරජාණන් වහන්සේ වදාළ මංගල ධර්ම දේශනාව වන දම්සක් පැවතුම් සූත්‍රයෙන් විස්තර කෙරෙන චතුරාර්ය සත්‍ය ධර්මයෙහි දෙවන ආර්ය සත්‍ය බව.
- සසර දුක් ඇතිවීමට හේතුව විස්තර කරයි. සත්වයා විවිධ දුක් පීඩාවලට පත් වන්නේ අහේතුකව නොව තම සිත් තුළ මුල් බැසගෙන ඇති අසීමිත තණ්හාව යයි ඉන් විස්තර කෙරෙන බව.
- ඕනෑම කෙනෙක් සසර නොයෙක් ජාතිවල ගමන් කරන්නේ තණ්හාව නිසා බව.
- තණ්හාව ප්‍රභේද 03 කින් යුක්ත වන බව (කාම කණ්හා /භව තණ්හා/ විභව තණ්හා)
- තණ්හාව දාසයකු මෙන් ක්‍රියා කරන බව.

(10 ශ්‍රේණිය 15 පාඩම 84 /85 පිටු ඇසුරින්)

ii) **පංච නීවරණ ධර්ම**

සිත කිලිටි කරන කුසල් සිත්වලට බාධා කරන, නිවන් මග ආවරණය කරන සිතුවිලි නීවරණ නමින් හඳුන්වන බව. ඒවා සිත්හි හට ගැනීමෙන් සැමට බාධා සැලසෙන බව. නීවරණ පහක් ඇති බව

- කාමච්ඡන්ද
- ව්‍යාපාද
- ථීන මිද්ධ
- උද්දච්ච කුක්කුච්ච
- විචිකිච්චා ( අර්ථය /ජලයේ උපමාව සමඟ / සාමඤ්ඤඵල සූත්‍රයට අනුව ලියා ඇත්නම්.)

* නීවරණ යටපත් වන ප්‍රමාණයට සිතේ සංවර බව ඇති වන බව.
* සමථ භාවනාවෙන් එය යටපත් කෙරෙන බව.

iii) **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා.**

* 1864 සැප්තැම්බර් 17 අගනුවර ව්‍යාපාරික පවුලක උපන් බව.
* දොන් කරෝලිස් හේවා විතාරණ පියතුමා සහ මල්ලිකා ධර්ම ගුණවර්ධන මැතිනියගේ පුත් රුවන දොන් ඩේවිඩ් හේවා විතාරණයි.
* බාල සොයුරන් තිදෙනෙකි. සොයුරියන් දෙදෙනෙකි.
* ක්‍රිස්තියානි දහම කරපින්නාගෙන සිටි රදලයන් එකල බහුල වීම නිසා බෞද්ධ භික්ෂුවටත්, බෞද්ධ ආගමටත් චෝදනා කිරීම නිසා වාද විවාද ඇතිවිය.
* පංච මහා වාද අතර පානදුරා වාදයෙන් (1873) මෙරට බෞද්ධ ප්‍රබෝධයක් වූ බව (මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි)
* ඕල්කට් තුමා සහ බ්ලැවැට්ස්කි මැතිනිය යටතේ බෞද්ධයකු වීම.
* දේශන පැවැත්වීම, සරසවි සඳරැස පුවත්පත ආරම්භය, බුද්ධගයාව බේරා ගැනීම, ලෝක ශාසනික සේවා සිදු කිරීම.
* පැවිදි වී 1933 අප්‍රේල් 29 අපවත් වීම.

(11 ශ්‍රේණිය 05 පාඩම)

iv) **තාදි ගුණය (අකම්පිත ගුණය /අකම්ප්‍ය ගුණය)**

අටලෝ දහමින් කම්පා නොවීමයි. ලැබීම් වලදී උද්දාමයට පත් නොවී නොලැබීම්වලදී ද කම්පාවට පත් නොවී සියල්ල විඳදරා ගෙන උපේක්ෂා සහගත වීමයි.

* බුද්ධ චරිතයෙන් නිදසුන් ලියා ඇත්නම්, ජීවිතයට ගලපා ඇත්නම් ලකුණු දෙන්න.

(11 ශ්‍රේණිය 2 පාඩම 13/14/15 පිටු)